# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රීලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - (මාර්ගගත) - 2021

## බුද්ධිමය දේපළ නීතිය

**පැ තුනයි (03)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න**

**(අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කෙරේ.)**

---

**1.** පහත දැක්වෙන එක් එක් අවස්ථාවන්හිදී පැන නගින නෛතික ගැටළු පිළිබඳව ශ්‍රී ලංකාවේ ප්‍රකාශන අයිතිවාසිකම් නීතිය පදනම් කර ගනිමින් පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(අ) ප්‍රියා, 'ලස්සන මගේ රට' ගීතය ගායනා කිරීමෙන් පසු ජනප්‍රියත්වයේ හිනිපෙත්තට නැගී ගායිකාවකි. සමස්ත ගීතය පේළි 50 කට වැඩි ප්‍රමාණයක් පැවතියද, පේළි දෙකක සමූහ ගායනය අතිශයින් ජනප්‍රිය විය. වෙනත් ගායිකාවක් වන මායා 'සුන්දර මගේ රට' නම් ගීතය පටිගත කර ඇති බවත් එහි අනෙකුත් පේළි 48 වෙනස් වුවත් 'ලස්සන මගේ රට' ගීතයෙහි සමූහ ගායනා පේළි දෙක ඒ ආකාරයෙන්ම අන්තර්ගත වන බව ප්‍රියා සොයා ගනියි. ප්‍රියා මේ පිළිබඳව මායාට අභියෝග කල විට, සමානතාවය පවතින්නේ ඉතා කුඩා කොටසක බැවින් එය ප්‍රකාශන අයිතිය උල්ලංඝනයක් සංස්ථාපනය නොකරන බව ඇයගේ ස්ථාවරය වෙයි.

(ආ) විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් වන කමල්, වසංගත කාලය තුළ තම විවේක කාලය චිත්‍රපටි බැලීමට පුරුදු වී සිටි අතර, ඔහු සොයා ගත් ආකාරයට ඒවාට ප්‍රවේශ වීම

මිල අධික කටයුත්තකි. තමාගේ සහ තම යහලුවන්ගේ පෞද්ගලික එකතුවකින්, මිතුරන් කණ්ඩායමක් සමඟ එකතුවී, මිනිසුන්ට සරළව ඇතුළු වී චිත්‍රපටි නැරඹිය හැකි අන්තර්ජාල අඩවියක් ඔහු ආරම්භ කළේය. මෙම කටයුත්ත මඟින් කිසිදු මුදල් ඉපයීමක් ඔහු සිදු නොකරයි.

(ඈ) පරිසර හිතකාමී සුඛෝපභෝගී හෝටල් පරිශ්‍රයක් අනන්‍ය ආකෘතියක් නිර්මාණය කිරීමේ පොරොන්දුව මත, තම සේවාදායකයා වෙත ආකෘතිය ඇඳීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පිනියක් වන නදීරා වෙත විශාල මුදල් ප්‍රමාණයක් ගෙවනු ලබයි. එම 'කුරුළු විලාස්' හෝටලය ඉදිකොට මාස හයකට පසුව, එම 'කුරුළු විලාස්' හෝටලයට ඒ ආකාරයෙන්ම සමාන තවත් හෝටලයක් එම ස්ථානයට සමීපව ඉදිකොට තිබෙන බව සේවාදායකයා සොයගනියි.

(ලකුණු 100)

**2.** කෝවිඩ් - 19 වසංගතයට විශ්වවිද්‍යාලයෙහි ප්‍රතිචාරයේ කොටසක් වශයෙන් සෙලානා විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය වරයෙකුගේ මූලිකත්වයෙන් පර්යේෂණ කණ්ඩායමක් විසින්, මාස ගණනක පුළුල් පර්යේෂණ වලින් පසුව පරිසර හිතකාමී, ස්වභාවිකව දිරාපත්වන, අඩු වියදම් සහ නැවත භාවිතා කල හැකි, ඉතා කුඩා අංශු වායුවක විසිර තිබෙන, රුධිරයෙහි හෝ වෙනත් ජලය පදනම් වූ පැල්ලම් වල අන්තර්ගත වෛරසය පලවාහැරිය හැකි සහ විනාශ කල හැකි මුහුණු ආවරණයක් වැඩි දියුණු කර තිබේ. වෙළඳපොලෙහි පවතින අනෙකුත් මුහුණු ආවරණ සමඟ සසඳා බලනවිට, මෙම බහුකාර්යය මුහුණු ආවරණය අපද්‍රව්‍ය බර සහ පරිසරයට ඇතිවන බලපෑම යන ද්විත්වයම අවම කරයි. මෙම නිපැයුම වාණිජ මට්ටමෙන් මහජනයාට ලබාගැනීමට හැකි කරවීමේ ඇති බරපතල අවශ්‍යතාව නිසා මෙම නව නිපැයුම සඳහා පේටන්ට් ආරක්ෂාව ලබාගැනීමට පර්යේෂක කණ්ඩායම අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකාවේ පේටන්ට් නීතිඥවරයකු වන ඔබ වෙත මෙම පර්යේෂණ කණ්ඩායම පැමිණ ඇතැයි උපකල්පනය කරන්න. මෙම නව නිපැයුම සඳහා ශ්‍රී

ලංකාවේ සහ විදේශයන්හි පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමේ හැකියාවත්, පේටන්ට් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය තුළ ඔවුන් මුහුණ දිය හැකි නෛතික බාදවන්ද තක්සේරු කරමින් පර්යේෂකයන්ට උපදෙස් දෙන්න. අදාළ නෛතික ප්‍රතිපාදන සහ නඩු තීරණ නීතිය ඇසුරින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 100)

**3.** ඔබ ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලයට අනුයුක්ත වෙළඳ ලකුණු පරීක්ෂකයෙක් යැයි උපකල්පනය කරන්න. ඔබ වෙත ලැබී ඇති පහත දැක්වෙන අයදුම්පත්වල ලියාපදිංචි කිරීමේ හැකියාව පිළිබඳව ඔබගේ සහේතුක මතය ලබාදෙන්න.

(අ) වෙරළක් මත සුදු අශ්වයකු පිට නැඟී පැද යන කාන්තාවකගේ පින්තූරයක් සහිත 'Adventurous' යන වචනය සහිත දුගඳ ඉවත් කරන පිරිමින්ගේ විලවුන් (deodorant) අලෙවිය සඳහා වන සලකුණක්. වෙරළක් මත කළු අශ්වයකුගේ පිට නැඟී පැදයන පිරිමියෙකුගේ පින්තූරයක් සහිත 'Adventure' යන වචනය සහිත පිරිමි සුවඳ විලවුන් අලෙවිය සඳහා වන සලකුණක් දැනටමත් ලියාපදිංචි වී තිබේ.

(ආ) 'දුම්බර ගමේ කලාල' යන වචන සහිත ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ වියන ලද කලාල නිෂ්පාදකයෙකු විසින් ඉදිරිපත් කරන ලද සලකුණක්.

(ඇ) දන්තාලේප වර්ගයක් අලෙවිය සඳහා විශ්මයාර්ථ/ හර්ෂාදී ලකුණක් (an exclamation mark) සහිත සලකුණක්.

(ඈ) ක්‍රීඩා සඳහා භාවිතා කරන පාවහන් සඳහා 'Tike' නම් වූ සලකුණ. සමානතාවකින් යුත්, ලියාපදිංචි සුප්‍රකට වෙළඳ ලකුණක් මැදපෙරදිග කලාපයේම බයිසිකල් අලෙවි කිරීමට යොදා ගනියි.

(ලකුණු 100)

**4.** ඔබ, කොළඹ පිහිටි නව්‍ය මෘදුකාංග ආයතනයක අභ්‍යන්තර නීති උපදේශක වරයෙකු (in-house legal counsel) යැයි උපකල්පනය කරන්න. වෙළඳ රහස් සොරකම් කිරීම සහ නඩු කටයුතු වැඩිවීමේ ප්‍රවනතාවය යන කරුණ සැලකිල්ලට ගනිමින්, “ශ්‍රී ලංකාව තුළ වෙළඳ රහස් නෛතිකව ආරක්ෂා කිරීම” යන මාතෘකාව යටතේ ආයතනයේ මෘදුකාංග සංවර්ධනය කරන්නන් හට ඉදිරිපත් කිරීමක් සිදුකරන ලෙස ආයතනයේ ඉහළ කළමණාකාරීත්වය ඔබගෙන් ඉල්ලීමක් කොට ඇත. එම ඉදිරිපත් කිරීම අතර තුර පහත දැක්වෙන පැතිකඩ ආමන්ත්‍රණය කරන ලෙස ඔබගෙන් ඉල්ලා සිටියි.

(අ) වෙළඳ රහස් අර්ථ නිරූපණය, එහි විෂයපථය සහ වෙළඳ රහස් ආරක්ෂා කිරීමේ වැදගත්කම;

(ආ) ජාත්‍යන්තර සහ දේශීය නෛතික ආරක්ෂණ ක්‍රමවේදය;

(ඇ) වෙළඳ රහස් ආරක්ෂණය සඳහා ගතයුතු පියවර; සහ

(ඈ) වෙළඳ රහස් ආරක්ෂණය සමඟ සබැඳුනු වාසි සහ අවාසි.

ඔබගේ ඉදිරිපත් කිරීම අදාළ නෛතික ප්‍රතිපාදන, නඩු තීරණ සහ ප්‍රයෝගික නිදසුන් ඇසුරෙන් සනාථ කල යුතුය.

(ලකුණු 100)

**5.** භූගෝලීය දර්ශක නිෂ්පාදනයන්හි සම්භවය හා ගුණත්වය හඟවන බව පාරිභෝගිකයින් විසින් තේරුම් ගනු ලබයි. ප්‍රමාණවත්ව ආරක්ෂා නොකරනු ලබයි නම්, ඒවා බොහොමයක් සතු කරගෙන පවතින කීර්තිය වංක වාණිජ ක්‍රියාකාරීන් විසින් අවනිදේශනය කිරීමට ඉඩ ඇත. සාවද්‍ය ලෙස භූගෝලීය දර්ශකයන් අවසර නැති පාර්ශවයන් භාවිත කිරීම තුලින් පාරිභෝගිකයන්ට සහ නිත්‍යානුකූල නිෂ්පාදකයන්ට අගතියක් සිදුවේ.

උක්ත ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නෙහිද? ශ්‍රී ලංකාවේ භූගෝලීය දර්ශක ආරක්ෂා කිරීමට අදාළ ප්‍රතිපාදන විවේචනාත්මකව පරික්ෂා කර , භූගෝලීය දර්ශක භාවිතය ප්‍රවර්ධනය සඳහා පවතින නෛතික ප්‍රතිපාදන කෙසේ සංශෝධනය විය යුතුද යන්න විශ්ලේෂණය කරන්න.

(ලකුණු 100)

**6.** නඩු තීරණ නීති විද්‍යාව ප්‍රවේශමෙන් සලකා බලන විට ශ්‍රී ලංකාව තුළ අසාධාරණ තරගයට එරෙහි ආරක්ෂාව සහ කූට නිදේශනය (passing off) නඩුකරය යන ද්විත්වයම පිළිගෙන ඇති බව අනාවරණය වෙයි. එසේම පොදු නීතියේ කූට නිදේශනය පිලිබඳ සංකල්පය අවනිදේශන ක්‍රියාවන්ට අදාළ වන අතර, පෘථුල අසාධාරණ තරඟය පිලිබඳ සංකල්පය අයුතු ලෙස අත්කර ගැනීමට එරෙහිව ආරක්ෂාව ලබාදෙන බව ප්‍රකට වෙයි.

උක්ත ප්‍රකාශය ඇසුරින් ශ්‍රී ලංකාව තුළ අසාධාරණ තරඟයට එරෙහි ආරක්ෂාව සහ කූට නිදේශනය අදාලවන ආකාරය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාළ නෛතික මූලධර්ම, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීති විද්‍යාව මඟින් සනාථ කරන්න.

(ලකුණු 100)

*******************************